21

# උම්මහාතුල් මුඃමිනීන්

නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණෝ ඉස්ලාමයේ දියුණුව, ඒකදේවවාදය ආරක්ෂා කරගැනීම, අසරණයින්ට පිහිටවීම යනාදී කරුණු සඳහා බහු විවාහ සිදුකළහ. මෙසේ නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමා විසින් විවාහ කර ගනු ලැබූ එතුමාගේ බිරින්දෑවරු "උම්මහාතුල් මුඃමිනීන්" ලෙස හැඳින්වෙති.

ඉස්ලාමය පිළිගැනීම යන එක ම හේතුව මත සහාබාවරු ඉතා දරුණු හිංසාවලට ලක්වූහ. මෙසේ හිංසාවට ලක්වූවෝ තමන්ගේ ප්‍රාණය, ශරීරය, ගෞරවය, දේපළ, සම්බන්ධකම් අහිමි ව අසරණ තත්ත්වයට පත්වූහ. ඉස්ලාමය ආරක්ෂා කර ගැනීමට බද්ර්, උහ්ද් වැනි යුද්ධවලට සහභාගි වූ සහාබාවරුන්ගෙන් ඇතැම් අය ෂහීද් වූහ. මේ නිසා ඔවුන්ගේ බිරින්දෑවරු වැන්දඹු භාවයට පත් වූහ. මේ අයුරින් වැන්දඹු කාන්තාවන්හට නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණෝ නව ජීවිතයක් ලබා දුන්හ. එතුමාණෝ ඔවුනතරින් කිහිප දෙනකු විවාහ කර ගත්හ. මෙසේ එතුමාගේ පිහිට ලැබූ උතුම් මව්වරුන් අතරින් හෆ්සා රළියල්ලාහු අන්හා, උම්මු සල්මා රළියල්ලාහු අන්හා ආදී උම්මහාතුල් මූඃමිනීන්වරුන් ගැන දැන ගනිමු.

## හෆ්සා රළියල්ලාහු අන්හා තුමිය

හෆ්සා රළියල්ලාහු අන්හා තුමියගේ පියා උමර් රළියල්ලාහු අන්හු තුමා වේ. ඇය නුබුව්වතයට වසර 5කට පෙර උපත ලැබුවා ය. ඇයගේ ප්‍රථම සැමියා හානිස් බින් හතබා රළියල්ලාහු අන්හු තුමා වේ. උමර් රළියල්ලාහු අන්හු තුමාණන් ඉස්ලාමය වැලඳගත් විට ඇයගේ පවුලේ සියලු දෙනා ම ඉස්ලාමය වැලඳ ගත්හ. එවිට කුරෛෂිවරුන් එල්ල කළ පීඩිත ක්‍රියා වැළක්වීම සඳහා දෙදෙනා ම අබිසීනියාවට හිජ්රත් කළහ. මදීනා හිජ්රතයට ද මොවුහු දෙදෙනා සහභාගි වූහ.

බද්ර් යුද්ධයට ද සහභාගි වූ හෆ්සා රළියල්ලාහු අන්හා තුමියගේ සැමියා හානිස් තුවාළ ලබා කෙටි කලකට පසු මදීනාවේ දී වෆාත් විය. එවිට හෆ්සා තුමියගේ වසය අවුරුදු 20කි. උමර් රළියල්ලාහු අන්හු තුමා ප්‍රථමයෙන් ම අබූබක්කර් රළියල්ලාහු අන්හු තුමාගෙනුත්, පසු ව උස්මාන් රළියල්ලාහු අන්හු තුමාගෙනුත් තම දියණිය වූ හෆ්සා විවාහ කරගන්නා ලෙස ඉල්ලා සිටියේ ය. දෙදෙනා ම එය පිළිගත්තේ නැත. පසු ව නබි තුමාගෙන් කරන ලද ඉල්ලීම පරිදි හිජ්රි 2වන වර්ෂයේ විවාහය සිදුකෙරුණි.

ආයිෂා රළියල්ලාහු අන්හා තුමියට පසු ව හෆ්සා තුමිය උසස් අධ්‍යාපනයක් හා ආගමික දැනුමක් ඇති තැනැත්තියක් වූවා ය. ලිවීමට, කියවීමට දන්නා මෙතුමියගෙන් කාන්තාවෝ පැමිණ ඉගෙන ගත්හ. 60කට අධික හදීස් ප්‍රමාණයක් හෆ්සා රළියල්ලාහු අන්හා තුමිය විසින් දන්වන ලද ඒවා වේ. ඇය දවල් කාලයේ උපවාසය රැකීමටත්, රාත්‍රියේ දෙවියන් අසලත් කාලය ගත කළා ය. ජනතාව අතර කුල භේද ඇතිවීමට ඇය තදින් විරුද්ධ වූවා ය. අබූබක්කර් රළියල්ලාහු අන්හු තුමාගේ කාලයේ එක්රැස් කළ අල්- කුර්ආනය පසු ව උමර් රළියල්ලාහු අන්හු තුමාගෙන් පසු ව හෆ්සා රළියල්ලාහු අන්හා තුමියගේ භාරයේ තිබුණි. මෙතුමිය තම 63 වැනි වියේ දී මදීනාවේ දී වෆාත් වූවා ය.

## උම්මු සල්මා රළියල්ලාහු අන්හා තුමිය

උම්මු සල්මා මව්තුමිය ගේ අන්වර්ථ නාමය හින්ද් වේ. මෙතුමිය කුරෛෂි වංශිකයෙකි. මෙතුමියගේ පියා අබූ උමෛයා වේ. මෙතුමියගේ පළමු සැමියා අබූ සල්මා මක්සූම් රළියල්ලාහු අන්හු ලෙස අමතනු ලැබුණු අබ්දුල්ලා බින් අබ්දුල් අසද් වේ. නබිත්වයේ අරම්භයේ ඇය තම සැමියා සමඟ ඉස්ලාමය පිළිගත්තා ය. ඇබිසීනියා, මදීනා හිජ්රත් සඳහා තම සැමියා සමඟ සහභාගි වූවා ය. මදීනාවට හිජ්රත් කළ කාන්තාවන්ගෙන් ප්‍රථමයා මෙතුමියයි. උහද් යුද්ධයේ ඇති වූ තුවාල හේතුවෙන් සැමියා වන අබූ සල්මා රළියල්ලාහු අන්හු අභාවප්‍රාප්ත වූවේ ය.

උම්මු සල්මා රළියල්ලාහු අන්හා තුමිය ඉතා ඉවසිලිවන්තියකි. කන්දක් යුද්ධයේ දීත්, කෛබර් යුද්ධයේ දීත්, ඇගේ සහභාගිත්වය ලැබිණි. හුදෛබියා සටනේ දී කුර්බානයට අදහස් දැක්වූයේ ද මෙතුමියයි. ඇය සතු ව පරිත්‍යාගශීලීබව, දැනුම හා ඥානය පිරිපුන් ව තිබුණි. තාබිර්න්වරුන්ට

ගුරුවරිය ලෙස සිටි මෙතුමිය හදීස් 378ක් දැනුම් දී ඇත. උම්මහාතුල් මුඃමිනීන්වරුන්ගෙන් අවසානයට වෆාත් වූයේ උම්මු සල්මා තුමියයි. මෙතුමිය තම 84 වැනි වියේ දී එනම් හිජ්රි වර්ෂ 63දී වෆාත් වූවා ය.

## අභ්‍යාසය

1. හෆ්සා මව්තුමියගේ පියා ------------------------------වේ.
2. හෆ්සා මව්තුමියගේ සැමියා ---------------- යුද්ධයේ දී තුවාල ලබා ෂහීද් වූයේ ය.
3. නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණෝ හෆ්සා මව්තුමිය හිජ්රි----------------------- වර්ෂයේ විවාහ කර ගත්හ.
4. උම්මු සල්මා රළියල්ලාහු අන්හා තුමියගේ පළමු සැමියා -------------------- යුද්ධයේ ෂහීද් වූයේ ය.
5. උම්මු සල්මා රළියල්ලාහු අන්හා තුමිය හුදෛබියා ගිවිසුමේ -------------------- දීමට අදහස් දැක්වූ කෙනෙකි.